

# මල් සුවඳට වැට බඳින්න කාටද පුළුවන්

සිංහල ගීත සාහිත්‍ය දෙස විමසුම් ඇසකින් බලන විට අපට බහුලව මුණගැසෙන්නේ පෙම්වතා විසින් පෙම්වතියට කෙරෙන බොළඳ ප්‍රේම යාදින්නයි. ඒ අතර

ඔය හඳ පතාල ආමි
මට දෙන්න දේහිණියේ
ඔබෙ පෙම් ද
සුදු අත සිඟාන ආමි

වැනි නිර්ලජ්ජිත පෙම් යාදිනි ද අපට මුණගැසේ අප මෙවර තෝරා ගත් මෙම ගීයේ කථා නායිකාව සිය වල්ලභයා සමග මිතුරු සමාගමයෙහි රැඳෙන්නට බෙහෙවින් ඇළුම් කරන්නියකි.ඇය සිය බලාපොරොත්තුව මුදුන් පමුණුවාලීමට උපාය මාර්ග කීපයක් ප්‍රයෝජනයට ගනී. උපාය මාර්ග කීවාට ඒවා ඉතාමත් අවිහිංසක උපාය මාර්ගයන්ය.ඇයගේ බණ්ඩාරයියා සවස මුණගැසෙන ඒ සුන්දර නිමේෂය උදකරගන්නට ඇය තෑගි හෝග ගොන්නක් සූදනම් කරගෙන සිටින්නීය. ඒවා බොහෝ සිත්ගන්නා සුළු තිළිණයන්ය. බණ්ඩාරයියා හවහට හමුවෙනවා නම් බදුලු විලේ රණමොණරා බඹරගලේ වලිකුකුළා තිළිණ කරන්නට ඇය සූදනමින් සිටී. රෑට නින්ද ගෙට එනතුරු හීන් හඬින් මුමුනන්නට ගායනා සීපද බොහොමයක් ඇයට කට පාඩම්ය.ඔහු එනවා නම් ඉහ ඉද්දර ඉඳගෙන ඇයට කියන්නට පුළුවන් බව ඈ යෝජනා කරයි. මේ සමස්ථ යෝජනාවලියේම අපූර්වත්වය වන්නේ ඒ කිසිදු යෝජනාවක රාග මිශ්‍රිත හැඟීමක් ජනිත නොවීමයි. මෙවන් සොඳුරු ආරාධනයක් ඉවතලිය හැක්කේ කිනම් පෙම්වතෙකුටද?.
මේ ගීයට ජයන්ත ගමගේ මධුර තනුවක් නිර්මාණය කොට ඇති නමුත් සංගීත භාණ්ඩ වල මියුරු නාද තාල රටාවන් තවත් එක් වූවානම් ගීතය තවත් පරිපූර්ණත්වයට පත්වන්නට තිබුණා යැයි මා සිතමි. ඇගේ මියුරු ගීතාවලියේ එන

මල්වනේ රෝස කැකුළු මැදින් මට පෙනේ
නිල්වලා යහන් ගැබේ කිරිසිනා දිලේ
වන්සැනේ ශෝක තැවුල් නිවාලන මෙනේ
එනු මැනේ මගෙ යහනට ඈත ලොවින්නේ

ගීතයද මගේ සිත්ගත් තවත් එක් ගීතයකි. මෙහි එන බන්ධුල විජේවීරයන්ගේ මධුර තනුව මා සිත් ඇද බැඳ ගත්තකි.

යළි උපදින්නම් අළුත් කෙනෙකු වී
නැවුම් ලොවක නව හිරු සඳු සෙවනේ
ඔබේ සෙනෙහසේ සුවය ලබා
අමතක කර දා පසු කළ මංපෙත
මා සිත සැනසේ පවන් රොදක් වී
ඔබේ දයාබර නෙතු කැල්මේ

ප්‍රවීණ ගීත රචිකා දයා ද අල්විස් ලියූ මේ ගීය අසන විට මට නම් සිතෙන්නේ සැබෑ දිවියේදී පිරිමියෙකු අසන්නට කැමතිම වදන් පෙළ මෙය විය හැකියි කියායි.

මගේ දෑස ඔබේ කියා
ඔබ පවසනවා
මම සැනසෙනවා

ආදරයේ අනන්ත මංතලාව ඔස්සේ
මගේ නුවන් ගමන් කළේ ඔබ පිටුපස්සේ
ඔබේ අතින් නලල තැබූ කුංකුම තිලකේ
ඔබගේ රුව නොදැක සොවින් නලලත වැළපේ

ඩෝල්ටන් අල්විස් ලියූ මේ මියුරු ගීතය සහ තවත් රසවත් ගී රැසක් ඇය ගායනා කර ඇති නමුදු සංඛ්‍යාත්මකව ඇය ගීත දහස් ගනන් ගායනා කොට නොමැත. ඈ ගැයූ ගීත අතළොස්ස එකකට එකක් නොදෙවැනි වන තරම් රසවත්ය.
මැණික් කැට දිය යට මිහිදන් වන විට ගොමරිටි උඩ මතුවන මෙවන් යුගයක කාලයේ වැලිතලාවෙන් යටව යා නොදී මේ මිණිකැට අනාගත පරපුරට හඳුන්වාදීමේ මුඛ්‍ය පරමාර්ථයෙන් මේ ලිපිය මා අතින් සැකසුනු බවද පැවසිය යුතුය.

නන්ද පතිරණ 453/1 නීලම්මහර පාර ගොඩිගමුව, මහරගම ඇයගේ ලිපිනයයි.

0114270678 ඇයගේ නිවසේ දුරකථන අංකයයි.

0772463855 ඇයගේ ජංගම දුරකථන අංකයයි.

මාගේ ප්‍රියතම ගායිකාව කවුරුන්දැයි යමෙකු මාගෙන් විමසුව හොත් ඇය නන්ද පතිරණ යැයි මා නොවලහා පවසමි. ඇය ඔබගේද ප්‍රියතම ගායිකාව වන්ට පුළුවන

මීට දශක ගනනකට ඉහතදී එඩ්වඩ් ජයකොඩි කැරකෙන රෝදේ ගීත කැසටය හෙළි දැක්වූ යුගයේදී ඇයගේ හඬ දොරින්
දොර පිළිරැව් දුන්නා මට මතකය. එඩ්වඩ් ගැයූ බිංදු බිංදු මල් වැස්සේ තෙමෙන්නට එපා ගීයේ සහය ගායිකාව ඇයයි. ඇය ගැයූ ඇයගේ මිහිරිතම ගීතය වන

ලන්ද දිගේ හැංගි හොරා සැඳෑ කාලයේ
රැන්දු සිනා ඇයිද මෙසේ මැකීලා ගියේ

ගීතය පවා ඇසූ පමනින් ඇගේ මියුරු ඇයට පමනක්ම සුවිශේෂී වූ ඒ ගැමි හඬ මතකයට නැගෙනු නොඅනුමානය.ඇගේ මියුරු ගීතාවලියේ එක් සුවිශේෂී ගීතයක් මගේ මතකයේ සැඟව තිබුණි. එය අපූරු ගීතයකි. මෙහි පදරචකයා කවුරුන්දැයි මා සොයා ගත්තේ මේ ලිපිය සැකසීමේ අරමුණෙනි. මේ ගීයේ අර්ථපතියා අන්කවරෙකුවත් නොව රත්ණ ශ්‍රී විජේසිංහයි. ඔහුගේ ප්‍රතිභා ශක්තිය මොනවට පැහැදිලි කොට ඇති තවත් එක් සංධිස්ථානයක් ලෙසද මෙය මම හඳුන්වමි.

බදුලු විලේ රණමොණරා
බඹරගලේ වලිකුකුළා
තෑගි දෙන්න මම සූදානම්
බණ්ඩාරයියෙ හවහට හමුවෙනවා නම්

නිල් ඝණ නිල් වනන්තරේ රුවට රුවේ මල් පිපිලා
අතක් බරට නෙලා දෙන්න හැකි එනවා නම්
මල් සුවඳට වැට බඳින්න කාටද පුළුවන්

රෑට නින්ද ගෙට එනතුරු හීන් හඬින් මුමුනන්නට
ඕසෙ ගායනා සීපද මට කට පාඩම්
ඉහ ඉද්දර ඉඳගෙන මට කියන්න පුළුවන්

පියල් යටවර
"කම්මිත්ත" "අතුරු පාර"
"දොරටු රකින්නෝ" ටෙලි
නට්‍ය අධ්‍යක්ෂක
yatawarap@gmail.com
skype — piyal_yatawara



නවවන පිටෙන්

"ඇයි හිනා වුනේ ?" මම ඇසීමි.

"ඉන්නව... ඉන්නව... කාටවත් සත පහක වැඩක් නැහැ... අරක්කු ඩිංගක් බොන්නෙ නැහැ. හයර් එකකට වත් කතා කරන්නෙ නැහැ. මහත්තුරු කී දෙනෙක් ආවද? මිනිහ කොළඹ එක්ක යන්න. කෝ මේ යකා ගේං එලියට බැස්සෙ නෑනෙ........ මන්ත්‍රිතුමාම කී පාරක් කතා කරාද නිකං ස්ටේජ් එකට ගොඩවෙලා යන්න කියල?.."

"පුදුම වැඩක්නෙ..... ඕක....." මට අන්තිම ප්‍රශ්නය ඇසීමට වෙලා මඳ වීය. මල ගෙදර කඩුල්ල ළඟටම ත්‍රීවිලය ළඟා විය. "ඉතින් හැබෑටම මල්ලි කී වතාවක් ඔය මිනිහ දැකල තියෙනවද?"

"මට තව හදිසි හයර එකත් ඇවිල්ල තියෙනව සර්" රියැදුරා සිය සෙල් පෝනය කනේ ඔබා ගනිමින් මගෙන් සමු ගත්තේය. "ආයෙ හම්බ වෙමුකො. සුනංගු වුනා......." ඔහු කුරුල්ලකු මෙන් ඉගිලි ගියේය.

කුඩා ළමෝ ලොකුවී තරුණ වී ඇත. බොහෝ දෙනා මා දුටුවේ අමුත්තකු මෙනි. බංඩය්යාත් සෝමක්කාත් මා හඳුනා ගන්නට බොහෝ වෑයමක් ගත්හ. උපන් ගමේම මා පිටගම් කාරයෙක් වූ කාලයේ ආශ්චර්යය මෙනෙහි කරමින් මම ආලින්දියේ පසෙකට වී හුන්නෙමි. වෙහෙස නිසා නින්ද යා ගෙන ආවේය. දඟ කොලු ගැටයකු මෙච්චල් කර ගනිමින් සිටි හැඩි දැඩි සිරුරකින් යුත් මිනිසෙක් පැමින මා දෙස විමසුම් ඇසකින් බලා සිටියේය. "මේ සේනාධීර මහත්තය නේද?"

මම ඔහු දෙස මොහොතක් බලා සිටියෙමි මට ඔහුගේ නියම නම කිසිවෙටකවත් මතකයට නොනගී. කකුල් තුනේ මිනිසාගේ අර ඥාති සොහොයුරා " අර බකමූනා මා ඉදිරියේ අවුරුදු විස්සකට විතර පසු කවදාවත් නැතිව "හූම්..... හූම්.. " ගායි.

"කෝ බං උඹලගෙ අය්ය ?" මම වහා ඇසුවෙමි.

"ඔන්න ඔහේ හිටිය. දැන් මල ගෙදරටත් ඒවි........." ඔහු ගණනකට නැතිව කීය.

හරියට සරකස් මඩුවකටවී අමුතු සතකු දිහා බලා සිටින්නට සූදානම් වන නව යොවුන් වියේ ගැටයකු මෙන් මගේ සිත ක්ෂණයකින් අවදිවීය. කෙසේ වෙතත් එය වේගයෙන් එලඹෙන පසුමැදිවියට නොගැලපෙන කුලප්පුවක් වීය.

මඳ වේලාවකින් පසු හීන්දෑරි මිනිසෙක් අහිංසක සිනාවක් පාමින් ගේ තුලට ගොස් මල සිරුරට ආචාර කොට හා අසල පුටුවක හිඳ ගත්තේය. කකුල් තුනේ මිනිසා ගැන ඇස් අයා ගෙන ඉදිරි කඩුල්ල දෙස බලා සිටි මට ඔහු ගැන කල්පනාවක් නොවීය. මොහු පැමිනියේ ගෙයි පිලිකන්න පැත්තෙනි. මිනිසා ඉලත්තට්ටුවෙන් බුලත් කොලයක් ගෙන ඉතා සැලකිල්ලෙන් හුනු ගෑවේය. මම නොසැලකිල්ලෙන් ඒ දෙස බලත්ම මට ළඟ පුටුව ළඟ ගණනකට නැතිව වැනෙමින් තිබුනු කකුල් කොටයක් දැක තිගැස්සී ගියෙමි. මිනිසාට නොඳැනෙන සේ අවධානය යොමු කරගෙන සිටි මිනිස්සු මගේ මේ ක්ෂණික ඉරියව් වෙනස් වීමෙන් කෙබඳු වින්දනයක් වින්දාදැයි අද පවා මට සිත ගත නොහැකිය.

මිනිසා ඇඳ සිටි දෙපොට සරම කකුල් තුනම අවුලක් නැතිව සගවා ගෙන සිටියේය. ගමක නමක් වෙනස් කරන්නට සමත් වූ මේ කකුල් කෙටිය ඒ කාලයේ කෙතරම් පුවත් මැව්වාද ? කාලයේ අවිය මගින් මොට කරන ලද මේ අස්වාභාවික පිහිටීම නැතහොත් අමතර කකුල දශක ගණනාවක් ම අපේ ගමේ තරුණයන්, තරුණියන් හා වැඩිහිටියන් උහුලා ගෙන සිටියාවද්දැයි මට සිතුනි. වැරදිලාවත් මේ මිනිසා ගමේ ප්‍රභූ පවුලක උපන්නා නම් මේ කකුලේ කතාව මීට වඩා වෙනස් වෙනු ඇත. ලෝකයේ හැමෙ-ර්ම බොරු කාරයෝ යැයි එක් කෙටිකතා කරුවෙක් කියා සිටි වගක් මට මතක තිබේ. මට මෙතෙක් ජීවිතයේ හමුවූ ලේඛකයින්, විචාරකයින්, දේශපාලනඥයින්, පූජකයින්, මහාචාර්යවරුන්, නෑදෑ හිත මිතුරන් හා උපදේශකින් අතරින් එය මට නැවත නැවතත් සනාථ වීය. එහෙත් මේ මිනිසා දුටු විට මට මේ කියමන ගැන දෙවරක් කල්පනා කරන්නට මට සිතෙයි. ඇස් බැන්දුමෙන්, මවා පෑමෙන් හෝ අයිතිය උදුරා ගැනීමෙන් ඕනැම දෙයක් විකුණා ගත හැකි මේ කාලයේ අඩු තරමින් සර්කස් මඩුවකව හෝ දූවිලි කන පදික වේදිකාවකට බම්මන්නකු මෙන් ගොඩවී තම අමතර කකුල විකුනා කෑමට කෑදර නොවන මේ මිනිසා ගේ හීන්දෑරී සිරුරට අරක් ගෙන සිටින ශ්‍රේෂ්ඨ ආත්මය දෙස මම ගෞරවයෙන් බලා සිටියෙමි. ■

පරිගණක අලුත්වැඩියාව
Professional Services
# Computer Repairs & Upgrades
# Virus Removals
# ADSL Professional installations
# Networking
# Brand New Computers for sales
# Laptop screen repairs
# Trouble shooting Browsing, E-mail & internet connection issues
# All Computer parts for low price
Jithendra Weerakoon
(IT Consultant)
02 Mosstrooper Court
Mill Park
Victoria, 3082
Australia
M: 0422 662 218
T: 03 9005 0893
E: jaytec@tpg.com.au
E: jith710@hotmail.com

